## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2016

-----------------------------------------------------

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ 24(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.5,390,000 ක් වූ මෝටර් වාහන 03ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂිත ප්‍රතිපාදනය රු.73,933 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු රු.466,200 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපචිත දිරිදීමනා වශයෙන් දක්වා තිබූ රු. 2,131,120 ක් සම්බන්ධයෙන් ගෙවිය යුතු පුද්ගලයින්ගේ නම්, ගෙවිය යුතු වටිනාකම හා අනෙකුත් විස්තර ඇතුළත් විස්තරාත්මක නාම ලේඛනය විගණනයට ඉදිරිපත් නොවිය.

### 2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ 15 (2) වගන්තිය අනුව ඔප්පුව යටතේ ප්‍රතිලාභ අහිමි වී ඇති පුද්ගලයන් සඳහා ප්‍රතිලාභ අහිමි වී ඇති බව මණ්ඩලය විසින් දැන්විය යුතුය. කෙසේ වෙතත්, 2015 වර්ෂයේ සිට 2017 ජූලි දක්වා රක්ෂණ ඔප්පු අක්‍රිය වී ඇති දායකයින් හඳුනාගැනීමට නොහැකිවී තිබුණු බැවින් ඔවුන් වෙත ඒ පිළිබඳ දැනුම් දීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.705,269 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 1,596,828 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.891,559 ක සුළු වර්ධනයක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.4,174,472 කින් අඩු වී තිබුණද වියදම රු.5,066,029 කින් අඩුවීම ඉහත වර්ධනයට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.18,535,954 ක ඌනතාවයක් වූ අතර 2013 සහ 2014 වර්ෂ වලදී මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණි. නැවතත් 2015 හා 2016 වර්ෂවලදී ඌනතාවයක් බවට පත්වී තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු.48,284,602 ක් වූ ආයතනයේ දායකත්වය විචලනයන් සහිතව වර්ධනය වී 2016 වර්ෂයේදී එය රු.102,558,470 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කර්යසාධනය

----------------

1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ 4 වන වගන්තියට අනුව, ධීවර හා කෘෂිකාර්මික නොවන අංශවල ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම, ඒ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම මණ්ඩලය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ විය.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් 2016 වර්ෂයට අදාල මණ්ඩලයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම හා ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) "සුරකුම සහ ආරස්සාව" යනුවෙන් යෝජනා ක්‍රම 02 ක් 2015 වර්ෂයේ දී හඳුන්වා දී තිබුණු අතර 2016 වර්ෂයේදී "සුරකුම" යෝජනා ක්‍රමයට දායකයින් 9,737 ක් සහ "ආරස්සාව" යෝජනා ක්‍රමයට දායකයින් 62,614 ක් ලෙස නව දායකයින් 72,351 ක් බඳවා ගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 35 ක වර්ධනයක් විය.

(ඇ) බඳවාගත් නව දායකයන්ගෙන් 61,389 කට ඔප්පු නිකුත් කර නොතිබු අතර ඉකුත් වර්ෂවලදී බඳවාගත් දායකයන්ටද ඔප්පු නිකුත් කිරීම් අවසන් කර නොතිබුණි. ඒ අනුව මණ්ඩලයේ විශ්‍රාම වැටුපට දායකවන්නන් හට ඔප්පු නිකුත් කිරීම ප්‍රමාදවීම එකී දායකයන්ගේ සුරක්ෂිත බව අඩු මට්ටමක පැවතීමට හා ඔප්පු අක්‍රීය වීමට හේතුවී තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා බඳවා ගෙන තිබූ සම්පූර්ණ දායකයින් සංඛ්‍යාව 565,645 ක් වුවත් ඉන් 2014 දෙසැම්බර් 31 දිනට අක්‍රීය දායකයන් සංඛ්‍යාව 288,234 ක් හෙවත් සියයට 51 ක් ලෙස හඳුනාගෙන තිබුණි. වාර්ෂිකව ඔප්පු අක්‍රීය දායක සංඛ්‍යාවේ ඉහළයෑමේ ප්‍රවණතාවයක් පැවතියද යෝජනා ක්‍රමය තුළ ඔවුන් රඳවාගැනීම කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුවීම අවම මට්ටමක පැවතුණි.

(ඉ) 2013 සිට 2016 දක්වා විශ්‍රාම වැටුප් අරමුදල වෙත දායක මුදල් ලැබීම් වල පහළ යාමක් හා විශ්‍රාම වැටුප් ගෙවීම්වල ඉහළ යාමක් නිරීක්ෂණය විය. 2016 වර්ෂය තුළ මුළු දායක ලැබීම් රු.161,869,987 ක් වූ අතර දායකයින් සඳහා මුළු ගෙවීම් රු.275,912,936 ක් වුයෙන් විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් සඳහා අවශ්‍ය වූ මුදලින් සියයට 70 ක් පමණක් දායක මුදල් ලැබීම්වලින් ආවරණය වී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම වැටුප් අරමුදලේ ශේෂය රු.1,988,765,922 ක් වූ අතර එදිනට මණ්ඩලය සතුව පැවති මුළු ආයෝජන වටිනාකම රු.1,878,365,869 ක් විය. ඒ අනුව අනාගතයේදී විශ්‍රාම වැටුප් බැඳීම් සඳහා ප්‍රමාණවත් අරමුදල් මණ්ඩලය සතුව රඳවා තබාගැනීම සම්බන්ධයෙන් අවධානමක් නොපවතීය යන්න බැහැරකළ නොහැකි විය.

(ඊ) දායකත්වය අහෝසි කර සාමාජික මුදල් ආපසු ගැනීම්, 2015 හා 2016 වර්ෂයේදී පිළිවෙලින් 1,587 කට රු. 24,444,852 ක්, හා 2189 කට රු.38,481,516 ක් වී තිබුණි. ඒ අනුව දායකයින් විශාල වශයෙන් දායකත්වය අහෝසිකර මුදල් ආපසු ලබා ගැනීමේ ප්‍රවනතාවයක් නිරීක්‍ෂණය වූ අතර එම දායකයන් තවදුරටත් රඳවා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් මණ්ඩලය විසින් අනුගමනය කර නොතිබුණි. එසේම දායක මුදල් හිඟ හිටීම නිසා දායකත්වය අක්‍රියවීමක් සිදුවන අවස්ථාවේදීම දායකයා දැනුවත් නොකිරීම මෙම තත්ත්වය ඉහළයෑමේ ප්‍රවනතාවට හේතුවී තිබුණි.

(උ) එකතුවන දායක මුදලින් ප්‍රතිලාභ ගෙවීම හැර සභාපතිවරයාගේ වාහන කුලිය ලෙස රු.1,317,500 ක් සහ ත්‍යාග ප්‍රදානෝත්සවයට රු.4,202,103 ක් වශයෙන් එකතුව රු.5,519,603 ක් වැයකිරීම හේතුවෙන් දායක අරමුදල හීනවී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් 2014 වර්ෂයට පෙර තිබූ පරිගණක පද්ධතියට දායකයන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම අරමුදල් ගෙවීම දක්වා තොරතුරු ඇතුළත් කිරීමට නොහැකිවූ බැවින් විශ්‍රාම වැටුප් අරමුදලින් 2014 වර්ෂයේ රු. 23,947,068 ක් වැය කර නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කර තිබුණි. එය පවත්වාගෙන යාමේදී පහත අඩුපාඩු හා දුෂ්කරතා මතුවී තිබුණි.

(i) අක්‍රිය හා සක්‍රිය දායකයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට නොහැකිවීම සහ විශ්‍රාම මොඩියුලය හරහා අවුරුදු 60 සම්පූර්ණවූ දායකයන් හඳුනාගැනීමට නොහැකි වීම.

(ii) පැරණි හා නව පරිගණක පද්ධති දෙකක් ක්‍රියාත්මකවීම නිසා වාර්තා ලබා ගැනීමේදී ගැටළු ඇතිවීම.

(iii) "ආරස්සාව" පූර්ව සැලසුමේ දායකත්ව අයදුම්පත් පරිගණක ගත කිරීමටත් විශ්‍රාම වැටුප් ගෙවීමට සහ දිරි දීමනා ගෙවීමට අදාළ දත්ත සැකසීමටත් නොහැකි වීම.

(iv) යම් දායක අංකයකට අදාළව වාරිකයක් පරිගණකගත කිරීමේදී එකම රිසිට්පත එකවිට එක් දායකයකු හෝ දායකයන් කිහිපදෙනෙකුට පරිගණක ගත කළ හැකි වීම නිසා විශේෂයෙන් බැංකු මගින් වාරික ගෙවීම් කරන දායකයන්ට සත්‍ය වශයෙන් වාරික ගෙවීමකින් තොරව විශ්‍රාම වැටුප් ලැබීමේ සහ දායකත්වයෙන් ඉවත්වීමේදී නොගෙවූ මුදලක් ආපසු ලබාගත හැකි වීමේ ඉහළ අවධානමක් තිබීම.

(v) අයදුම්පත් පරිගණකගත කිරීමේදී පවතින ක්‍රමය අනුව හැඳුනුම්පත් අංකයන් 9 ක් පමණක් සටහන් කළ හැකි වුවත්, වර්තමානයේදී නව හැඳුනුම්පත අනුව අංකයන් 12 ක් සටහන් කළ යුතු බැවින් එම පහසුකම මෙම පරිගණක පද්ධතිය තුළ නොතිබීම.

(ආ) ඉහත අඩුපාඩු මගහරවා ගැනීම සඳහා නව පරිගණක පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු.2,550,946 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් රඳවාගෙන තිබුණද 2017 ජූලි 20 දින තෙක් එම පරිගණක පද්ධතිය ලබා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා දායකයන් බඳවා ගැනීම් හා වාරික රැස්කිරීම නිවැරදිව හඳුනාගත හැකි පරිදි දත්ත පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබීම නිසා ඒ සඳහා දායකවන නිලධාරීන්ට දිරිදීමනා ලෙස ගෙවිය යුතු රු.2,131,120 ක ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සලසා තිබුණ ද එම ගෙවීම් අවසන් කර නොතිබුණි.

(ඇ) 2004 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා බැංකු වෙත සෘජුව තැන්පත් කරන ලද දායකයන්ගෙන් ලැබී තිබුණු රු.1,261,347 ක් හා 2015 වර්ෂයේදී හා 2016 වර්ෂයේදී විටින් විට පරිගණක පද්ධතියේ සිදු වූ අක්‍රිය තත්ත්වය හේතුවෙන් රු.8,310,995 ක් වශයෙන් එකතුව රු.9,572,342 ක් හඳුනා ගැනීමට නොහැකි තැන්පතු වශයෙන් ගිණුම්වල දක්වා තිබුණි. ඒවා හඳුනාගෙන අදාළ දායකයන්ගේ ගිණුම්වලට බැර නොකිරීම නිසා දායකයින්ගේ නිවැරදි ශේෂයන් මත ප්‍රතිලාභ ගෙවීම් සිදුනොවන බව නිරීක්ෂණය විය.

(ඉ) අවශ්‍ය අරමුදල් වෙන්කර ගැනීමකින් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව, රජයේ තක්සේරුව වූ රු.165,000,000 ක් වූ ගොඩනැගිල්ලක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම වෙනුවෙන් විශ්‍රාම වැටුප් අරමුදලින් රු.195,000,000 ක් ගෙවා මිලදී ගෙන තිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 180 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 160 ක් වූයෙන් පුරප්පාඩු 20 ක් පැවතිණි..

(ආ) මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුර වර්ෂ 03 ක කාලයක් පුරප්පාඩුව පැවති අතර මෙම බඳවා ගැනීම සඳහා රු.72,677 ක වියදම් කර පුවත්පත් දැන්වීමක් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසයේදී පළකර තිබුණි. කෙසේ වුවද, 2017 ජූලි 20 දින තෙක්ම මෙම බඳවා ගැනීම සිදුකර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2014 – 2016 වර්ෂයන් සඳහා මණ්ඩලය විසින් සකස් කරන ලද සංයුක්ත සැළැස්මේ දුර්වලතා සහ බාධක වශයෙන් පහත කරුණු හඳුනා ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම දුර්වලතා සහ බාධක විසඳා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(අ) කාලානුරූපීව හා සමාජ අවශ්‍යතා අනුව පනත සංශෝධනය කර ගැනීම.

(ආ) සමාජ ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් නොමැතිවීම.

(ඇ) යෝජනා ක්‍රම සඳහා රජයේ දායකත්වය නොලැබීම.

(ඇ) තොරතුරු තාක්ෂණ පද්ධතිය අවශ්‍යතා අනුව සංවර්ධනය නොවීම.

(ඉ) ආයතනයේ දායකයන් සමග සන්නිවේදනය අවම මට්ටමක පැවතීම හා දායකයන් බඳවා ගැනීමෙන් පසු විපරම් අවම මට්ටමක පැවතීම.

(ඊ) දායක මුදල් ගෙවීම ප්‍රේෂණය සහ ගිණුම්ගත කිරීම දුර්වලතා හා හඳුනා නොගත් ශේෂ ඉහළ මට්ටමක පැවතීම.

**5.2 ක්‍රියාකාරී සැළැස්ම**

---------------------

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැළැස්ම 2016 ඔක්තෝබර් 13 දින අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම ක්‍රියාකාරී සැළැස්ම 2016 ඔක්තෝබර් මාසයේ සකස් කිරීම නිසා ප්‍රධාන ක්‍රියාකාරකම් 07 ක් සහ උප ක්‍රියාකාරකම් 31 ක් එයට ඇතුළත් කර තිබුණද මාස 02 ක කාලය තුළ අවසන් කිරීමට නොහැකිවී තිබුණි. ඒ අනුව ක්‍රියාකාරී සැළැස්ම මණ්ඩලයේ අරමුණු ඉටුවන ආකාරයට සකස් කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ප්‍රධාන අරමුණ ධීවර සහ කෘෂිකාර්මික නොවන අංශවල ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුපක් ලබාදීම සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීමය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අපේක්ෂිත බඳවා ගැනීම් ඉලක්කය ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 15 සිට සියයට 91 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් කළමනාකරණ පාලන කාරකයන් ලෙස අයවැය යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා වෙත දැනුම් දෙන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | දායක මුදල් කළමනාකරණය | i. | දායකයන් බඳවා ගැනීමේදී ඔප්පු නිකුත් කිරීම ප්‍රමාද වීම සහ නිකුත් කරන ලද ඔප්පු නිවැරදි නොවීම. |
| | | ii. | අක්‍රීයවන දායකයන් සංඛ්‍යාව නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වීම. |
| | | iii. | බැංකු මගින් රැස් කරන වාරික සටහන් කිරීමේදී දායකයා හඳුනා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොතිබීම. |
| (ආ) | පරිගණක ගත කිරීම් | | පවත්නා පරිගණක පද්ධතිය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි නොපැවතීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇති පුද්ගලයන් නිසි පරිදි හඳුනා ගැනීමට අපොහොසත් වීම. |